# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 6 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය කාලය : පැය 02

**සැලකිය යුතුය.**

- **පළමු කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **දෙවන කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.**

### I කොටස

- ප්‍රශ්න අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

(1) සිදුහත් බෝසතාණන් මව්කුස පිළිසිඳ ගත්තේ,
1. වෙසක් පෝ දිනක ය.
2. ඇසල පෝ දිනක ය.
3. පොසොන් පෝ දිනක ය.
4. උඳුවප් පෝ දිනක ය.

(2) "මෙයින් අවුරුදු දහසක් ඉකුත්වූ කල බුදු කෙනෙකුන් උපදිනවායයි" දෙවියන් හඬ නගා කියමින් ඇවිදිනවා. මෙම ප්‍රකාශය,
1. ධර්ම කෝලාහලයයි
2. බුද්ධ කෝලාහලයයි
3. සංඝ කෝලාහලයයි
4. දේව කෝලාහලයයි

(3) "රජතුමනි මේ කුමරු ඒකාන්තයෙන් ම බුදු වෙනවා. එබැවින් මම සිනාසුණෙමි. කුමරු බුදුවන්නට පෙර මා මිය යන බැවින් හැඬුවෙමි." මෙම ප්‍රකාශය සිදු කරන ලද්දේ කවුරුන් විසින්ද?
1. සුදොවුන් රජු විසිනි
2. අසිත තාපසතුමා විසිනි
3. කිසා ගෝතමිය විසිනි
4. පස්වග තවුසන් විසිනි

(4) "අග්ගෝ හමස්මි ලෝකස්ස" මෙහි සරල තේරුම,
1. මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි යන්නයි.
2. මම ලොවට අග්‍ර වෙමි යන්නයි.
3. මම ලොවට තිලක වෙමි යන්නයි.
4. මේ මාගේ අවසන් උපත යන්නයි.

(5) මහාමායා දේවිය කලුරිය කළ පසු සිදුහත් කුමරු හදා වඩා ගත්තේ,
1. සුජාතා සිටු දේවියයි.
2. කෝසල දේවියයි.
3. මහා ප්‍රජාපතී ගෝතමී දේවියයි.
4. බන්ධුල මල්ලිකා දේවියයි.

(6) සුද්ධෝදන රජතුමා තම කුමරුට දෙවන වැඳුම සිදු කළේ,
1. අසිත තවුසාණන් ඉදිරියේ ය.
2. වප්මඟුල් දිනයේ ය.
3. සර්වමිත්‍ර බමුණා ඉදිරියේ ය.
4. කොණ්ඩඤ්ඤ බමුණා ඉදිරියේ ය.

(7) සිදුහත් කුමරුගේ සන්සුන් බව දැක නිබ්බුත පද ප්‍රකාශ කළේ,
1. ප්‍රජාපතී ගෝතමී කුමරියයි.
2. යශෝධරා කුමරියයි.
3. කිසා ගෝතමී කුමරියයි.
4. සුජාතා දේවියයි.

(8) පැවිදි වූ සිදුහත් කුමරුට සිවුරු පිරිකර පූජා කළේ,
1. ඝටීකාර බ්‍රහ්මයා විසින් ය.
2. පස්වග තවුසන් විසින් ය.
3. ඡන්න නම් ඇමතියා විසින් ය.
4. සතර වරම් දෙවිවරු විසින් ය.

(9) දෙවන පන්සිල් පදයට අනුව ලද දෙයින් සතුටුවන බව දැක්වෙන කවි පදය කුමක්ද?

1. නොදුන් දෙයක් හොර සිතකින් නොගන්නෙමි.
2. අනුන් ලවා හොරකම් නොකරමි.
3. හොරෙන් ගැනුම අනුමත නොමකරන්නෙමි.
4. ලැබෙන්නෙකින් සතුටුව දිවි ගෙවන්නෙමි.

(10) පන්සලේදී වන්දනා මාන කළ යුතු අනුපිළිවෙල,

1. වෙහෙර වහන්සේ, බෝධීන් වහන්සේ, පිළිම වහන්සේ
2. වෙහෙර වහන්සේ, පිළිම වහන්සේ, බෝධීන් වහන්සේ
3. පිළිම වහන්සේ, වෙහෙර වහන්සේ, බෝධීන් වහන්සේ
4. බෝධීන් වහන්සේ, පිළිම වහන්සේ, වෙහෙර වහන්සේ

(11) ජාතික කොඩියෙහි සතර බ්‍රහ්ම විහරණ පෙන්නුම් කරන්නේ,

1. කහපාට සිහයාගෙනි
2. අසිපතිනි
3. කහපාට තීරුවෙනි
4. බෝපත් සතරෙනි

(12) පහත දැක්වෙන වචන වලට භාවිතා වන ශාසනික වචන පිළිවෙලට යෙදී ඇති පිළිතුර තෝරන්න.

- වතුර
- අතුගානවා
- මිදුල

1. අමදිනවා, මලුව, පැන්
2. පැන්, මලුව, අමදිනවා
3. පැන්, අමදිනවා, මලුව
4. අමදිනවා, පැන්, මලුව

(13) පැන් පූජා කරන ගාථාවේ මුල් පද පේළිය වන්නේ,

1. පූජේමි බුද්ධං කුසුමේනනේන
2. අධිවාසේතු නෝ භන්තේ
3. කායේන වාචා චිත්තේන
4. සුගන්ධං සීතලං කප්පං

(14) යස්ස මූලේ නිසින්නෝව.... මෙම ගාථාව සජ්ඣායනා කරමින් වන්දනා කරන්නේ,

1. බෝධීන් වහන්සේට ය.
2. පිළිම වහන්සේට ය.
3. චෛත්‍ය රාජයාණන් වහන්සේට ය.
4. සංඝයා වහන්සේට ය.

(15) අර්ධ පර්යංකායන් (පාද පසුපසට නමා) භාවනාව සඳහා හිඳගන්නේ,

1. උපාසකවරුන් ය.
2. ස්වාමීන් වහන්සේලා ය.
3. උපාසිකාවන් ය.
4. හිත මිතුරන් ය.

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට අදාළ පිළිතුර තෝරා ලියන්න.

(16) රාහුල කුමරුගේ මව ....................................................... වේ.

(17) දියුණුවේ දොරටු ....................................................... තම පියා විසින් පුතාට පෙන්වා දෙන ලදී.

(18) සීල, සමාධි, ප්‍රඥා ....................................................... නමින් හැඳින්වේ.

(19) තමා වරදින් වැළකීම, අන් අය ලවා වැරදි නොකරවීම, අන් අය කරන වැරදි අනුමත නොකිරීම යන අංග ....................................................... සීලයට අයත් වේ.

(20) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යනුවෙන් හඳුන්වන්නේ, ....................................................... වේ.

***(ත්‍රිශික්ෂාව, ත්‍රිකෝටික පාරිශුද්ධ, සිව්බඹ විහරණ, යශෝධරා දේවිය, හයක්)***

## II කොටස

- **පළමු වන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20කි. අනෙක් ප්‍රශ්නවල එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 60කි.**

(1) දෙවන වාරයට ඔබ සිදු කළ ඇගයීම ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i) ඔබ විසින් සිදු කරන ලද දෙවන වාර ඇගයීම නම් කරන්න.

ii) එම ඇගයීම කරගෙන යාම සඳහා ඔබ උදව් ලබා ගත් 2කුගේ නම් ලියන්න.

iii) ඔබ මේ සඳහා සූදානම් වූ ආකාරය විස්තර කරන්න.

iv) ගුරුතුමා ඔබට ලබා දුන් උපදෙස් දෙකක් ලියන්න.

v) මෙම ඇගයීම සඳහා සූදානම් වීමේදී ඔබට ඇති වූ ගැටළු දෙකක් ලියන්න.

vi) අභියෝග ජය ගැනීම සඳහා ඔබ කළ යුතු කාර්යයන් දෙකක් ලියන්න.

vii) මස මානවක ඇතුළු පිරිස ආරක්ෂා කළ ප්‍රතිපත්ති දෙකක් ලියන්න.

viii) එකමුතුව වැඩ කිරීමේ අගය පෙන්වා දෙන වාක්‍ය දෙකක් ලියන්න.

ix) මස මානවක ඇතුළු පිරිස වාසය කළ ගමේ නම කුමක්ද?

x) මස මානවක තරුණයාගෙන් ඔබට ගත හැකි ආදර්ශ 2ක් ලියන්න.

(2)

i) සිදුහත් තවුසාගේ ගුරුවරු දෙදෙනෙක් නම් කරන්න.

ii) පංචශීලයේ පළමු සිල්පද තුන ලියා දක්වන්න. (පාලි)

iii) සිදුහත් කුමරුගේ චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ 5ක් ලියන්න.

(3)

i) පංචශීලයේ හතරවන හා අවසාන සිල්පද වල තේරුම් කෙටියෙන් සඳහන් කරන්න.

ii) ත්‍රිකෝටි පාරිශුද්ධ ශීලයෙහි අංග තුන නම් කරන්න.

iii) ත්‍රිකෝටි පාරිශුද්ධ ශීලය ඔබ අනුගමනය කරන ආකාරය කෙටියෙන් ලියන්න.

(4)

i) බුදුරජාණන් වහන්සේ සිඟාලක ගෘහ පුත්‍රයාට දේශනා කළ සූත්‍රය කුමක්ද?

ii) දෙමාපියන් විසින් දරුවන්ට ඉටු කළ යුතු යුතුකම් 3 ක් ලියන්න.

iii) ඔබ විසින් දෙමාපියන්ට ඉටු කළ යුතු යුතුකම් 5ක් ලියන්න.

(5)

i) බුදුරජාණන් වහන්සේ අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රය දේශනා කළේ කා හටද?

ii) ක්‍රියාවක හොඳ නරක තෝරා ගැනීමට යොදා ගත හැකි මිනුම් දඬු මොනවාද?

iii) ඔබ කරන ලද යහපත් වූ ක්‍රියාවන් පිළිබඳ වාක්‍ය 5ක් ලියන්න.

(6)

i) "නතං කම්මං කතං සාධු" යන ගාථාව සම්පූර්ණ කර ලියන්න.

ii) එහි සරල අදහස ලියන්න.

iii) අත්තූපනායික ධර්ම පරියාය යනු කුමක්දැයි පැහැදිලි කරමින් ඔබ එය ක්‍රියාවට නැංවූ අවස්ථා 5ක් ලියන්න.

(7)

i) බුදුගුණ සිහිකරන පාඨයේ මුල් පේළිය ලියන්න.

ii) වන්දනා කිරීම සඳහා අප පන්සලට යන විට රැගෙන යා යුතු දේවල් තුනක් ලියන්න.

iii) පන්සලට ගිය පසු අප විසින් කළ යුතු වතාවත් පිළිබඳ විස්තර කරන්න.